මගේ අංකය : JSC/SEC/CIR-L/2024

**සියලුම මහේස්ත්‍රාත්වරුන් වෙත,**

**විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කළ හැකි සංඛ්‍යාව දැනුම් දීම**

ශීර්ෂගත කරුණට අදාළව පුනරුත්ථාපන කාර්යාංශයේ කොමසාරිස් ජනරාල් වෙනුවට, කොමසාරිස් (පුනරුත්ථාපන) බ්‍රිගේඩියර් , ඩී.සී.සී.ඩී.ආර්. වෛද්‍යසේකර ආර්එස්පී මහතා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත පිටපතක් සහිතව ලේකම්, අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අංක පුනකා/ප්‍ර/01/01/2024 (107) හා 2024.10.14 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපිය සුදුසු කටයුතු සඳහා අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියේ පල කොට ඔබගේ අවධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත.

02. ඒ අනුව එම ලිපිය මේ සමඟ අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පල කොට සුදුසු කටයුතු සඳහා ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්.සංජීව සෝමරත්න
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

2024 ඔක්තෝබර් මස 21 වැනි දින,

කොළඹ 12,

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

පුනරුත්ථාපන කාර්යාංශය
புனர்வாழ்வுப் பணியகம்
BUREAU OF REHABILITATION
අධිකරණ,රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය
நீதி,பொதுநிருவாக,உள்நாட்டலுவல்கள்,மாகாணசபைகள்,உள்ளூராட்சிமன்றம்தொழில் அமைச்சு
MINISTRY OF JUSTICE, PUBLIC ADMINISTRATION, HOME AFFAIRS, PROVINCIAL COUNCILS, LOCAL GOVERNMENT AND LABOUR

අංක: 462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල.
இல: 462/2,கடுவெலவீதி, கனஹேன,பத்தரமுல்ல.
No. 462/2, Kaduwela Road, Ganahena, Battaramulla.


මගේ අංකය / எனது இல / My No: පුනකා/ප්‍ර/01/01/2024 ( 107 )
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.10.14

JUDICIAL SERVICE COMMISSION SECRETARIAT 18 OCT 2024

ලේකම්,
අධිකරණ,රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය.

ගරු ලේකම් තුමණි,

**<u>විෂ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කළ හැකි සංඛ්‍යාව දැනුම් දීම.</u>**

යොමුව:

අ. අංක JSC/SEC/CIR- L/2022 හා 12/2012 දරණ 2022.09.20 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපිය.

1. මෙම කාර්යාංශය යටතේ පාලනය වන පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුනෙහි දළ වශයෙන් පුනරුත්ථාපනලාභීන් 1120 ක පමණ ප්‍රමාණයක් එකවර පුනරුත්ථාපනය සඳහා යොමු කළ හැකි අතර, දැනට පුනරුත්ථාපනය වනු ලබන පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව සහ තවදුරටත් එම මධ්‍යස්ථානයන් වෙත ඇතුළත් කර ගත හැකි පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව පහත සඳහන් පරිදි බැව් දන්වා සිටිමි.

| මධ්‍යස්ථානය | පුනරුත්ථාපනය කළ හැකි පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණය | දැනට සිටින පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණය | තවදුරටත් ඇතුළත් කර ගත හැකි පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණය |
|---|---|---|---|
| ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු | 500 | 71 | **429** |
| තෘතියික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර | 500 | 108 | **392** |
| ඒකාබද්ධතා මධ්‍යස්ථානය - වව්නියාව | 120 | 68 | **52** |
| **එකතුව** | **1120** | **247** | **873** |

2. තවද පුනරුත්ථාපන ක්‍රියාවලිය මාස 06 ක කාල සීමාවක් තුළ සිදු කරනු ලබන බැවින් සහ පුනරුත්ථාපනලාභීන් වරින්වර පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත ඇතුළත් වන ආකාරය අනුව අදාළ කාල සීමාව අවසානයේ සමාජගත කරනු ලබන පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණයන් අනුව අඛණ්ඩව පුනරුත්ථාපන සඳහා යොමු කිරීමේ හැකියාවක් පවතී.

3. ඒ අනුව යොමුගත චක්‍රලේඛයෙහි දක්වා ඇති නිර්ණායකයන්ට අනුකූලව පුනරුත්ථාපනලාභීන් පුනරුත්ථාපනය කිරීමේ හැකියාවක් පවතින අතර ඔබ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක අදාළ ආයතන දැනුවත් කර විෂ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවැසි ඉදිරි කටයුතු සිදු කරන මෙන් ඉල්ලා සිටිමි.

**ඩී සී සී ඩී ආර් වෛද්‍යසේකර ආර්එස්පී**
බ්‍රිගේඩියර්
කොමසාරිස් (පුනරුත්ථාපන)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් වෙනුවට

Sec. Div. (Resi Kumara)
Pls. publish in the web.
Secretary J.S.C
18/10/2024

පිටපත් :
1. ලේකම් - මහජන ආරක්ෂක අමාත්‍යාංශය
2. අධිකරණ සේවා කොමිෂන් සභාව - සියලුම මහේස්ත්‍රාත්වරුන් දැනුවත් කිරීම සඳහා
3. සභාපති - විෂ මත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ භාවිතය වළක්වාලීම සඳහා කාර්ය සාධක බලකාය
4. පොලිස්පති - පොලිස් මූලස්ථානය
5. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් - බන්ධනාගාර මූලස්ථානය
6. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය - බස්නාහිර පළාත


පොදු / பொது / General: +9411 2577457, +9411 2883891
ෆැක්ස් / தொலைநகல் / Fax: +9411 2883737, +9411 2883899
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: bcg.rehabilitation@gmail.com
වියුණු අඩවිය / இணையத்தளம் / Web Site: www.bor.gov.lk